ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 සැප්තැම්බර් මස 26 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය : අංක 06 – 2017

පවතින සහ අපේක්ෂිත දේශීය හා විදේශීය සාර්ව ආර්ථික වාතාවරණය පිළිබඳ සලකා බලා දැනට පවතින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය බව 2017 සැප්තැම්බර් මස 25 වැනි දින පැවති රැස්වීමේදී මුදල් මණ්ඩලයෙහි අදහස වූ අතර, ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික දැනට පවතින මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

ඉහත තීරණය ගැනීමෙහිලා මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් ප්‍රධාන කරුණු සැලකිල්ලට ගනු ලැබීය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තු අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය, 2017 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 3.8 ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයට සාපේක්ෂව 2017 වසරේ දෙවන කාර්තුව තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.0 ක මධ්‍යස්ථ වේගයකින් වර්ධනය විය. අයහපත් කාලගුණික තත්ත්ව සහ දුර්වල විදේශ ඉල්ලුම ආර්ථික වර්ධනය කෙරෙහි අඛණ්ඩව බලපෑම් ඇති කළේය. එකතු කළ අගය අනුව සලකා බලන විට, ඉදිකිරීම්, පතල් හා කැනීම්, මූල්‍ය සේවා

ක්‍රියාකාරකම්, සහ තොග සහ සිල්ලර වෙළඳාම් යන උප අංශ වසරේ පළමු භාගයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. කෙටිකාලීන වර්ධන අපේක්ෂා සඳහා අඛණ්ඩව බාධා ඇති වුවද, ආර්ථිකයේ ඉදිරි ක්‍රියාකාරකම් නිරූපණය කරනු ලබන දර්ශක මගින් මැදිකාලීන ආර්ථික අපේක්ෂාවන්හි වර්ධනයක් පෙන්නුම් කරනු ලබන අතර, යෝජිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ අපේක්ෂිත විදේශ ආයෝජන ලැබීම් තුළින් එම වර්ධන අපේක්ෂා ළඟා කර ගත හැකි වනු ඇත.

බදු සංශෝධනවල පදනම් බලපෑම මෙන්ම, ආහාර අයිතමවල ඉහළ මිල ගණන් පිළිබිඹු කරමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද. 2013=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද. 2013=100) මත පදනම්ව මනිනු ලබන මතුපිට උද්ධමනය 2017 අගෝස්තු මාසයේ දී ඉහළ ගියේය. කො.පා.මි. දර්ශකය සහ ජා.පා.මි. දර්ශකය මත පදනම් වූ මූලික උද්ධමනය ද 2017 අගෝස්තු මාසයේ දී ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වුවද, 2016 වසර ආරම්භයේ සිට පැවති දැඩි මුදල් තත්ත්වයෙහි බලපෑම හේතුවෙන් 2017 වසර අවසානයේ දී උද්ධමනය අපේක්ෂිත මැදි තනි අගයක මට්ටම දක්වා අඩු වී ඉන්පසුව ස්ථාවරව පවතිනු ඇතැයි පුරෝකථනය කොට ඇත.

දේශීය වෙළඳපොළෙහි පවත්නා ඉහළ නාමික සහ මූර්ත ණය පොලී අනුපාතිකවලට ප්‍රතිචාර වශයෙන් වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනය, 2016 ජූලි මාසයේ සිට ක්‍රමානුකූලව මන්දගාමී විය. වසරේ මේ දක්වා වූ කාලසීමාව තුළදී මහ බැංකුව විසින් රජය වෙත ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වුව ද බැංකු අංශය මගින් රජය වෙත ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතිණි. වසර තුළදී රාජ්‍ය සංස්ථාවලට ලබාදුන් ණය ප්‍රසාරණයෙහි මන්දගාමී වීමක් දක්නට ලැබිණ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම සහ වාණිජ බැංකු සතු විදේශීය වගකීම් අඩු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකු අංශයෙහි ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය වීම හේතුවෙන් පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනය අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතිණි. මේ අතර, රජයේ සුරැකුම්පත් වෙළඳපොළ ඵලදා අනුපාතිකවල මෑතකාලීනව සිදුවූ අඩු වීමට ද ප්‍රතිචාර වශයෙන් තැන්පතු සහ ණය පොලී අනුපාතික කිසියම් ස්ථායී වීමක් පෙන්නුම් කරයි.

විදේශ අංශය සැලකූ විට, 2017 ජූලි මාසය වන විට අඛණ්ඩව පස්වන මාසයටත් අපනයන ආදායම ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, කාලගුණික තත්ත්වයේ

අහිතකර බලපෑම මත බලශක්ති උත්පාදනයේ සහ ආහාර සැපයුමේ ඇතිවූ අවහිරතා හේතු කොටගෙන ඉහළ ගිය ආනයන වියදම හේතුවෙන් 2017 ජූලි මාසය වන විට සමුච්චිත වෙළඳ හිඟය තවදුරටත් පුළුල් විය. සංචාරක පැමිණීම් සහ ඒ ආශ්‍රිත විදේශ විනිමය ලැබීම් ද වසරේ මේ දක්වා කාලය තුළ ඉහළ ගියේය. 2017 ජූලි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද ඉහළ ගිය නමුත්, මැද පෙරදිග කලාපයේ මන්දගාමී ආර්ථික ක්‍රියාකාරීත්වය සහ භූ දේශපාලනික අවිනිශ්චිතතා හේතුවෙන් වසරේ මේ දක්වා කාලය තුළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහළ ගියේය. රජයේ සුරැකුම්පත් වෙළඳපොළ වෙත මෙන්ම කොළඹ කොටස් හුවමාරුව වෙත ද අඛණ්ඩව විදේශ ආයෝජන ප්‍රවාහ ලැබීම් දක්නට ලැබිණ. මෙම වර්ධනයන් මධ්‍යයේ, ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් බිලියන 1.1 ක විදේශ විනිමය මිලදී ගත් අතර, දළ නිල සංචිත ප්‍රමාණය, 2016 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 6.0 හා සාපේක්ෂව 2017 සැප්තැම්බර් මස 21 වැනි දින වන විට එ.ජ. ඩොලර් බිලියන 7.3 දක්වා ඉහළ ගියේය. විනිමය අනුපාතිකය තීරණය වීමේ නම්‍යශීලී බව හේතු කොටගෙන දේශීය විදේශීය විනිමය වෙළඳපොළ මත වන පීඩනය බොහෝ දුරට අඩු වී ඇති අතර, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2016 වසරේ දී අවප්‍රමාණය වූ සියයට 3.8 ට සාපේක්ෂව 2017 සැප්තැම්බර් 22 වැනි දින වන විට සියයට 2.0 කින් අවප්‍රමාණය වී ඇත.

මෙම පසුබිම තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), පිළිවෙළින්, සියයට 7.25 සහ සියයට 8.75 යන දැනට පවතින මට්ටමේ පවත්වා ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කළේය.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය:** | **ප්‍රතිපත්ති පොලී අනුපාතික නොවෙනස්ව පවතී** |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR)<br>නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR)<br><br>ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 7.25<br>සියයට 8.75<br><br>සියයට 7.50 |

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2017 නොවැම්බර් මස 07 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**සංඛ්‍යා ඇමුණුම:**

### සංඛ්‍යා සටහන 01 : මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | | | | | 2017 | | |
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව් වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | පළමු අර්ධය |
| කෘෂිකාර්මික | -0.2 | -5.7 | -2.0 | -8.4 | -4.2 | -3.2 | -2.9 | -3.1 |
| කර්මාන්ත | 9.1 | 2.0 | 5.9 | 9.2 | 6.7 | 6.3 | 5.2 | 5.8 |
| සේවා | 3.7 | 3.6 | 4.8 | 4.6 | 4.2 | 3.5 | 4.5 | 4.0 |
| ද.දේ.නි. | 5.1 | 2.4 | 4.6 | 5.3 | 4.4 | 3.8 | 4.0 | 3.9 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යා සටහන 02 : උද්ධමනය

| මාසය | | දෙසැ-16 | මාර්-17 | අප්‍රේ-17 | මැයි-17 | ජුනි-17 | ජූලි-17 | අගෝ-17 |
|---|---|---|---|---|---|---|---|---|
| මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %) | කො.පා.මි.ද. (2013=100) | 4.5 | 7.3 | 6.9 | 6.0 | 6.1 | 4.8 | 6.0 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.2 | 8.6 | 8.4 | 7.1 | 6.3 | 6.3 | 7.9 |
| මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස %) | කො.පා.මි.ද. (2013=100) | 5.8 | 7.3 | 6.8 | 5.2 | 5.1 | 4.9 | 6.0 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.7 | 7.0 | 5.9 | 4.7 | 4.1 | 4.2 | 4.8 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### සංඛ්‍යා සටහන 03 : මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රු. බිලි.) | | | | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | දෙසැ-16 | මාර්-17 | ජුනි-17 | ජූලි-17 | අගෝ-17 | දෙසැ-16 | මාර්-17 | ජුනි-17 | ජූලි-17 | අගෝ-17 |
| සංචිත මුදල් | 856 | 892 | 892 | 895 | 911 | 27.1 | 12.7 | 17.8 | 15.5 | 16.0 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 5,406 | 5,677 | 5,873 | 5,987 | 6,051 | 18.4 | 20.0 | 21.2 | 21.2 | 21.3 |
| ශුද්ධ විදේශීය වත්කම් | -231 | -371 | -246 | -125 | -50 | 22.4 | 15.6 | 50.0 | 71.4 | 82.2 |
| ශුද්ධ දේශීය වත්කම් | 5,637 | 6,049 | 6,119 | 6,112 | 6,101 | 15.9 | 17.0 | 14.7 | 13.6 | 15.8 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය | 1,972 | 2,215 | 2,235 | 2,254 | 2,238 | 12.1 | 13.3 | 11.4 | 10.9 | 15.5 |
| රාජ්‍ය ව්‍යවසායන් සඳහා ලබා දුන් ණය | 495 | 553 | 551 | 513 | 503 | -5.3 | 7.5 | 13.7 | 8.8 | 13.9 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 4,204 | 4,375 | 4,505 | 4,556 | 4,609 | 21.9 | 20.4 | 18.6 | 18.0 | 18.0 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 6,630 | 6,951 | 7,221 | 7,375 | 7,457 | 15.9 | 18.2 | 20.3 | 20.5 | 20.7 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| පොලී අනුපාතික (%) | 2016 දෙසැම්බර් අවසානයට | 2017 මාර්තු අවසානයට | 2017 අප්‍රේල් අවසානයට | 2017 ජූනි අවසානයට | 2017 ජූලි අවසානයට | 2017 අගෝ අවසානයට | 2017 සැප්තැම්බර් 25 දිනට |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 7.00 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 8.50 | 8.75 | 8.75 | 8.75 | 8.75 | 8.75 | 8.75 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 8.42 | 8.75 | 8.72 | 8.75 | 8.75 | 8.20 | 8.07 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 8.72 | 9.63 | 9.73 | 9.60 | 9.44 | 8.87 | - |
| දින 182 | 9.63 | 10.62 | 10.70 | 10.29 | 9.71 | 9.30 | 8.94 |
| දින 364 | 10.17 | 10.98 | 11.02 | 10.47 | 9.99 | 9.67 | 9.10 |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 11.52 | 11.79 | 11.78 | 11.70 | 12.26 | 11.37 | 11.37 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 13.20 | 13.40 | 13.52 | 13.73 | 13.83 | 13.90 | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 14.37 | 14.54 | 15.00 | 14.90 | 14.96 | 15.12 | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 8.17 | 8.81 | 8.89 | 9.13 | 9.19 | 9.21 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 10.46 | 11.38 | 11.43 | 11.66 | 11.78 | 11.78 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 11.17 | 11.49 | 11.38 | 11.57 | 11.72 | 11.04 | - |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව